# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 02/2018

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2018 පෙබරවාරි මස 09වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයින් මාරු කිරීම්**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 78 වන වගන්තියට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ I වන වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කෙරේ.

අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් අපේක්ෂා කරමින් ඉදිරිපත් කර ඇති සේවකයින්ගේ මාරුවීම් අයදුම්පත් වසරක දී මාස තුනකට වරක් සලකා බැලීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017.12.07 දින පැවති සිය 977වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

ඒ අනුව නිසි පරිදි පුරවන ලද මාරුවීම් අයදුම්පත්, අදාළ උසස් අධ්‍යාපන ආයතන / ආයතනවල එකඟතාව අනතුරුව ලබා ගැනීම පිණිස පහත පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලඟා විය යුතුය.

මාර්තු මාසයේ අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර
ජූනි මාසයේ අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර
සැප්තැම්බර් මාසයේ අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර
දෙසැම්බර් මාසයේ අවසාන වැඩ කරන දිනට හෝ ඊට පෙර

තවද, උසස් අධ්‍යාපන ආයතන / ආයතන වෙනත් ආකාරවලින් පුරප්පාඩු පිරවීමට පියවර ගැනීමට පෙර අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් අපේක්ෂා කරන සේවකයින්ට ප්‍රමුඛතාවය ලබා දීමට පියවර ගත යුතු බවට වන 2012.01.04 දින අංක 974 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් කෙරෙහි ඔබේ අවධානය යොමු කරනු ලැබේ.

ඉහත තීරණය 2018.03.02 දින සිට ක්‍රියාත්මක වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්

10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසි/එච්ආර්/5/1